**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු අතර (රේගු, දේශීය ආදායම්) අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ පටිපාටිය - 2027**

ස්ථාන මාරුවීම් සඳහා අදාළ සේවාවන් පහත පරිදි වේ.

| | | රැඳී සිටිය හැකි උපරිම කාලසීමාව |
|---|---|---|
| 1. | රජයේ භාෂා පරිවර්තක සේවය | වසර 5 |
| 2. | සංවර්ධන නිලධාරි සේවය | වසර 5 |
| 3. | කළමනාකරණ සේවා නිලධාරි සේවය | වසර 5 |
| 4. | ඒකාබද්ධ රියදුරු සේවය | වසර 5 |
| 5. | කාර්යාල සේවක සේවය | වසර 5 |

**1.** ඉහත දෙපාර්තමේන්තු සඳහා ස්ථාන මාරු අයදුම් කිරීමේදී සම්පූර්ණ කළයුතු සුදුසුකම්

1.1. මුදල් අමාත්‍යාංශයට පළමු පත්වීම් ලැබූ හෝ පරිවාස කාලය තුළ මෙම අමාත්‍යාංශයට පැමිණි ඉහත සේවාවල නිලධාරීන් සේවයේ ස්ථිර වූ පසු එතැන් සිට වසර 02ක් සම්පූර්ණ වීමෙන් අනතුරුව පමණක් ඉහත දෙපාර්තමේන්තු වෙත අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි. එහිදී ඔවුන්ගේ මුදල් අමාත්‍යාංශයේ සේවා කාලය සලකනු ලබන්නේ පරිවාස කාලය සම්පූර්ණ කරන ලද දින සිටය. සීමිත තරඟ විභාග වලින් සමත්ව උසස්වීම් ලබා පැමිණෙන නිලධාරීන් ද එක් අවුරුදු පරිවාස කාලය සම්පූර්ණ කරන දිනය, ඔවුන් මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය ලෙස සලකා ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

1.2. අභ්‍යන්තර ස්ථානමාරුවීම් යටතේ සංවර්ධන නිලධාරීන් සඳහා පමණක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අයදුම් කළ හැකි අතර ඉහත සඳහන් අනෙක් සේවාවන්හි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු ලබාගැනීම සඳහා ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථානමාරු යටතේ අයදුම් කළ යුතු වේ. රේගු දෙපාර්තමේන්තුව වෙත ඉහත සඳහන් සියලු සේවාවන්හි නිලධාරීන් සඳහා අයදුම් කළ හැක.

1.3. මුදල් අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘතියක හෝ ආයතනයක ද්විතීයන පදනම මත සේවය කර ඇත්නම් එම කාලසීමාව, ප්‍රතිලාභ සහිත සේවා ස්ථානයක රැඳී සිටිය හැකි උපරිම කාලසීමාවෙන් අඩුකරනු ලැබේ.

1.4. මෙම ඡේදයේ පහතින් දක්වා ඇති වගුවේ සඳහන් පරිදි, වරින්වර අමාත්‍යාංශ විෂය පථයෙන් ඉවත්වූ හා අමාත්‍යාංශ විෂය පථයට අයත්වූ දෙපාර්තමේන්තුවල සේවයේ නියුතු ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් ස්ථාන මාරු උපලේඛනයට ඇතුළත් කිරීමේදී එම දෙපාර්තමේන්තු මුදල් අමාත්‍යාංශ විෂය පථය යටතේ පැවති කාලසීමාව තුළ මෙම අමාත්‍යාංශය මගින් එම දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන්ට **පමණක්** අමාත්‍යාංශයට පැමිණි දිනය අනුව අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබාදෙනු ලැබේ.

- තවද ප්‍රතිලාභ සහිත ආයතනයක සේවය කරන ලදුව දැනට මෙම අමාත්‍යාංශ විෂය පථයට අයත්ව ඇති දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන් පිටතට වූ ස්ථාන මාරුවලට යටත් වේ.

- තවද ඉදිරියේදී මෙම අමාත්‍යාංශ විෂය පථයට ඇතුළත් කරනු ලබන ආයතන අමාත්‍යාංශ විෂය පථය යටතේ පවතින කාලසීමාව තුළ පමණක් මෙම අමතාාංශයෙන් හෝ ඍජුවම හෝ එම ආයතන වෙත අනුයුක්ත කරනු ලබන නිලධාරීන් **පමණක්** අභ්‍යන්තර ස්ථාන මාරු ලේඛනවලට ඇතුළත් විමට සුදුසුකම් සපුරනු ලබයි.

| | දෙපාර්තමේන්තුව | අමාත්‍යාංශයෙන් ඉවත්වූ දිනය | නැවත අමාත්‍යාංශ විෂය පථය යටතට පත්වූ දිනය | නැවත අමාත්‍යාංශයෙන් ඉවත්වූ දිනය | නැවත අමාත්‍යාංශ විෂය පථය යටතට පත්වූ දිනය |
|---|---|---|---|---|---|
| 01 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන | 2015.01.18 | 2019.12.10 (2153/12 දරණ අති වි. ගැසට් පත්‍රය) | 2021.07.07 (2235/45 දරණ අති වි. ගැසට් පත්‍රය) | 2022.04.28 (2277/53 දරණ අති වි. ගැසට් පත්‍රය) |
| 02 | ජාතික ක්‍රමසම්පාදන | 2015.01.18 | | | |
| 03 | තක්සේරු | - | - | | |
| 04 | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | | | | |
| 05 | ආනයන හා අපනයන පාලන | 2015.09.27 | 2019.12.10 | - | - |
| 06 | සමාගම් රෙජිස්ට්‍රාර් | - | 2019.12.10 | 2022.10.26 (2303/17 දරණ අති වි. ගැසට් පත්‍රය) | - |
| 07 | ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ | 2015.09.21 | 2018.12.28 (2103/33 දරණ අති වි. ගැසට් පත්‍රය) | - | - |
| 08 | විදේශ සම්පත් | 2015.01.18 | | | |
| 09 | කළමනාකරණ විගණන | 2017.06.07 | | | |

1.5. විශ්‍රාම යාමට ආසන්න නිලධාරියෙකු ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා 2026.12.31 දිනට වයස අවුරුදු 55 සම්පූර්ණ කල යුතු අතර, අවම වශයෙන් අමාත්‍යාංශය යටතේ සේවා කාලය අවුරුදු 03ක් සම්පූර්ණ කර තිබිය යුතුය. මේ සම්බන්ධයෙන් සලකා බලනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10:2 යන අනුපාතයෙනි.

1.6. වයස අවුරුදු 55 සම්පූර්ණ කිරීමෙන් පසු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10:2ක අනුපාතයෙන් නිලධාරීන් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු කිරීමේදී ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ රැඳීසිටින පිළිවෙළ අනුව නිලධාරීන් සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ.

**2.** <u>ස්ථාන මාරු අයදුම්පත්‍</u>

2.1 ස්ථාන මාරු අයදුම්පත් 2026.07.31 දිනට පෙර එවන මෙන් දන්වා ඇති අතරම එදිනෙන් පසු ලැබෙන අයදුම්පත් නොසලකා හරිනු ලැබේ.

2.2 මුදල් අමාත්‍යාංශයට වාර්තා කළ ලිපියේ පිටපතක් සමඟ අදාළ අයදුම්පත්‍රය යොමුකළ යුතුය. සෘජුවම අදාල දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුකර ඇති නිලධාරීන් අදාල දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ අනුයුක්ත කිරීමේ ලිපියේ පිටපතක් සමග ස්ථාන මාරු නියෝගයේ පිටපතක් අමුණා එවීම අනිවාර්ය බව සැලකිය යුතුය.

2.3 යම් නිලධාරියකු විසින් ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමේ දී අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්නම් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන අතරම අමාත්‍යාංශයෙන් පිටතට ස්ථාන මාරුකිරීමට යටත් වේ.

**3.** <u>ස්ථාන මාරු කමිටු</u>

3.1 ස්ථාන මාරු කමිටු පහත පරිදි පිහිටවනු ලබයි.

3.1.1. ස්ථාන මාරු කමිටු

ස්ථාන මාරු සඳහා ඉදිරිපත් වී ඇති අයදුම්පත්‍ර අනුව ස්ථානමාරු ලැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සලකාබැලීම සඳහා පොදුවේ ස්ථාන මාරු කමිටුවක් පත්කර ගනු ලබයි. මෙම ස්ථාන මාරු සම්බන්ධයෙන් අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටියේ 1 හි සඳහන් සුදුසුකම් හා 4 හි සඳහන් පොදු කරුණු අදාළ කරගනු ලැබේ.

3.1.2. ස්ථාන මාරු අභියාචනා කමිටු

ස්ථාන මාරු සම්බන්ධයෙන් යොමු වී ඇති අභියාචනා තවදුරටත් සැලකිල්ලට ගනු ලබන අතර අභ්‍යන්තර ස්ථාන මාරු පරිපාටියේ 1 හි සඳහන් සුදුසුකම් හා 4 හි සඳහන් කරුණු හා අභියාචනය කරනු ලබන කරුණුවල සාධාරණත්වය සැලකිල්ලට ගනු ලබයි.

**4.** <u>ස්ථාන මාරු හා ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කිරීමේදී සලකා බලනු ලබන වෙනත් කරුණු :</u>

4.1 රේගු හා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වලට ඉල්ලා ඇති ස්ථාන මාරු අයදුම්පත් සලකා බලනු ලබන්නේ ඒවායේ අවුරුදු (05)කට හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙනය.

4.2 ඉහත දෙපාර්තමේන්තුවල වසර 5 ක සේවා කාලයක් අවසන් කරන දිනයේදීම එම දෙපාර්තමේන්තු වලින් පිටතට ස්ථාන මාරු කරනු ලැබීමට යටත් වේ. වසර 05ක සේවා කාලය ගණන් ගනු ලබන්නේ ලිත් වර්ෂය පදනම් කොටගෙන නොව එම දෙපාර්තමේන්තුවලට නිලධාරියෙකු ස්ථාන මාරු කරන ලද දිනය අනුව වේ. ඒ අනුව 2026.12.31 දිනට හා එදිනෙන් පසු 2027.12.31 දින දක්වා වසර 05 සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථාන මාරුකිරීම් වලට යටත් වේ.

4.3 ඉහත සඳහන් දෙපාර්තමේන්තුවල මීට පෙර සේවය කර ඇති නිලධාරීන් නැවතත් එම දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු නොකරන අතර, 2027 වර්ෂයට අදාළ ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.3.1 ඡේදය යටතේ දක්වා ඇති දෙපාර්තමේන්තුවක හෝ ද්වීතියන පදනම මත ප්‍රතිලාභ සහිත ආයතනයක සේවය කර ඇති නිලධාරීන් ද රේගු හා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරු කරනු නොලැබේ. ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 04/2026හි 5.2 ඡේදයේ සඳහන් කරුණු ද මීට අදාළ කරගනු ලබන අතර, ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවල සේවය කරන අවුරුදු 55 ඉක්ම වූ නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරීන්ට අගතියක් නොවන ලෙස ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

4.4 ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක වසර 05 සම්පූර්ණ කර ඇති නිලධාරීන් විධිමත් ස්ථාන මාරුවීමක් ලැබෙන තුරු, මෙම අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ පවතින දෙපාර්තමේන්තුවක හෝ අභ්‍යන්තර ස්ථාන මාරු ලබන නිලධාරියෙකු වෙනුවට තාවකාලිකව අනුයුක්ත කරන්නේ නම් එම නිලධාරියාට නියමිත දිනට විධිමත් ස්ථාන මාරුවීමක් ලබාදීම සඳහා ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

4.5 එසේම, ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක වසර 05 සම්පූර්ණ කර (2027.06.30 දිනෙන් පසු) නැවත අමාත්‍යාංශය වෙත පැමිණෙන නිලධාරීන්, වසර 05ට වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ගේ ලේඛනයට ඇතුළත් කොට ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ලබාදීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරන අතර එවැනි නිලධාරීන් සඳහා සුහද ස්ථාන මාරු හෝ අනුප්‍රාප්තිකයෙකු රහිත ස්ථාන මාරුවීම් හෝ සඳහා අවස්ථාව ලබාදෙනු නොලැබේ.

4.6 ප්‍රියමනාප සේවා ස්ථානයක හෝ කාර්යාලයක සේවය කරන නිලධාරියෙකු එවැනිම වෙනත් කාර්යාලයකට ස්ථාන මාරු නොකළ යුතුය. විභාග දෙපාර්තමේන්තුව (සංවර්ධන නිලධාරී සේවය, කළමනාකරණ සේවා නිලධාරි සේවය හා කාර්යාල සේවක සේවය සඳහා අදාල නොවේ.) / විදේශ කටයුතු අමාත්‍යාංශය (රජයේ භාෂා පරිවර්තක සේවය, සංවර්ධන නිලධාරී සේවය හා කළමනාකරණ සේවා නිලධාරි සේවය සඳහා අදාළ නොවේ) / මෝටර් රථ ප්‍රවාහන (සංවර්ධන නිලධාරී තනතුරු නොමැත) / ආගමන හා විගමන / වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / රජයේ මුද්‍රණාලය / රේගු / දේශීය ආදායම් / සුරාබදු දෙපාර්තමේන්තුව ප්‍රියමනාප දෙපාර්තමේන්තු හා ආයතන ලෙස සලකනු ලැබේ. එවැනි සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරියෙකු එම ආයතනයක සේවා කාලය වසර 05ක් නොඉක්මවූ විට ඉතිරි කාලය මෙම අමාත්‍යාංශය යටතේ වන ප්‍රියමනාප දෙපාර්තමේන්තුවක රැඳී සිටීමට අවස්ථාව ලබාදිය යුතුය.

4.7 ප්‍රියමනාප යැයි සැලකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා කාලය ගණනය කිරීමේ දී එම කාලය තුලදී ලබාගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත සහ අඩ වැටුප් සහිත) කාලය ගණනය කරනු නොලැබේ. ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියක් ස්ථාන මාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කරන විට ලබා ඇති ප්‍රසූත නිවාඩු පිළිබඳව සඳහන් කිරීම අනිවාර්ය වන අතර එසේ නොකොට අභියාචනා මණ්ඩලවලදී ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් කරන දැනුම්දීම් සැලකිල්ලට නොගැනේ.

4.8 එම දෙපාර්තමේන්තු / ආයතන වලට ස්ථාන මාරු කිරීමේදී මෙම අමාත්‍යාංශය හෝ ඒ යටතේ වන වෙනත් දෙපාර්තමේන්තු වල සේවය කළ යුතු අවම සේවා කාලයක් නියම නොකරන අතරම, එම ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තු වලින් ස්ථාන මාරු වී යන සේවක සංඛ්‍යාව මත ස්ථාන මාරු කරන නිලධාරීන් සංඛ්‍යාව තීරණය කෙරේ. මෙම දෙපාර්තමේන්තු වලින් පිටතට යන සංඛ්‍යාවට වඩා මාරුවීම් ඉල්ලා ඇති සංඛ්‍යාව වැඩි වන විට තෝරාගැනීමේ සාමාන්‍ය පිළිවෙත වන්නේ, මුදල් අමාත්‍යාංශයේ අඛණ්ඩ වැඩිම සේවා කාලය ඇති හා පරිවාස කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් වේ. එකම දිනයේ දී අමාත්‍යාංශයට පැමිණ ඇති නිලධාරීන්ගේ ප්‍රමුඛතාවය තීරණය කරනු ලබන්නේ ඔවුන්ගේ මුළු සේවා කාලය සැලකිල්ලට ගෙනය. ඉහත දිනයන් දෙකම සමාන වන අවස්ථාවේදී නිලධාරියාගේ හෝ නිලධාරිනියගේ වයස සැලකිල්ලට ගනු ලබයි.

4.9 2027 වර්ෂයේ ප්‍රතිලාභ ලබන සේවා ස්ථාන වලට ස්ථාන මාරුවීම් කරනු ලැබීමේදී මුදල් අමාත්‍යාංශ සේවා කාලය ගණනය කරනු ලබන්නේ දැනට සේවයේ යෙදී සිටින සේවයට උසස්වීම් ලැබ එක් අවුරුදු වැඩබැලීමේ කාලය සම්පූර්ණ කරනු ලබන දින සිටය.

උදාහරණ : කාර්යාල සේවක සේවයේ සිට කළමනාකරණ සේවා නිලධාරි සේවය

4.10 මෙම අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුවක අවුරුදු 05ක හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් වෙනුවෙන් කල්වේලා ඇතිව සුදුසු නිලධාරීන් පුහුණු කරවා ගැනීම අවශ්‍ය වන අතර, මාරුවීම් ලද නිලධාරියෙකු අදාළ දිනයේ දී එම නිලධාරියාගේ හිමිකම් වලට බාධා නොවන පරිදි ස්ථාන මාරු කළ යුතුය.

4.11 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ දී දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ නොකර ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් එසේ නිර්දේශ නොකිරීමට හේතුන්ද සඳහන්

කර එවිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් ස්ථාන මාරු කමිටුව විසින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ එකඟතාවය මත ස්ථාන මාරුකිරීමට අදාළ තීරණය ගනු ලැබේ.

4.12 මෙම දෙපාර්තමේන්තු වලට වාර්ෂික ස්ථාන මාරු කිරීමෙන් පසුව එම වර්ෂයේ ඉදිරියට ඇති වන පුරප්පාඩු පිරවීම සඳහා පොරොත්තු ලේඛනයක් වාර්ෂිකව සකස් කරනු ලබන අතර, එම පොරොත්තු ලේඛන වලින් බැහැරව ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.

4.13 සංවර්ධන නිලධාරීන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවල ප්‍රධාන කාර්යාලවලට පමණක් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබාදෙනු ලැබේ. එම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සඳහා වන ස්ථාන මාරු, එම දෙපාර්තමේන්තුවේ පවතින අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිවලට අනුව ක්‍රියාත්මක වනු ඇත.

4.14 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී අභියාචනා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර, නැවත අභියාචනා සලකා බලනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකු ස්ථාන මාරු කර ඇත්නම් ඒ අනුව නිලධාරියා නියමිත දිනයේ දී මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා අනිවාර්යෙන්ම ක්‍රියාකල යුතුය. එසේ නොකරන්නේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුව අදාළ බලධාරීන්ට වාර්තා කිරීමට සිදුවේ.

4.15 දේශීය ආදායම් හා රේගු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වෘත්තීය සමිති නියෝජිතයින් සම්බන්ධයෙන් 03/2018 ඒකාබද්ධ සේවා ස්ථාන මාරු පරිපාටිය අනුව කටයුතු කරනු ලැබේ. ප්‍රතිලාභ සහිත දෙපාර්තමේන්තුවක අවුරුදු 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති වෘත්තීය සමිති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත්වන අතර, ඔවුන් කැමති නම් ප්‍රතිලාභ රහිත දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරුවීමක් ලබා දිය හැකිය.

4.16 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යටතේ නිලධාරියෙකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ස්ථාන මාරුවීමක් ලබා දී ඇති විටෙක, සුදුසුකම් සම්පූර්ණ කර තිබියදී

i) එම නිලධාරියා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කරගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා නොබලන අතර එවැනි නිලධාරීන් අමාත්‍යාංශයෙන් පිටතට ස්ථාන මාරුකිරීමට යටත්වේ.

ii) සේවා අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් අදාල ස්ථාන මාරුව අවලංගු කරගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන්නේ නම් එම කාලය, ප්‍රියමනාප සේවා ස්ථානයේ රැඳී සිටිය හැකි උපරිම කාලසීමාවෙන් අඩුකරනු ලැබේ.

4.17 අදාළ සේවයේ අය ප්‍රතිලාභ සහිත සේවා ස්ථාන වලට ස්ථාන මාරු කිරීමේ දී පන්ති / ශ්‍රේණි අනුව නොව අමාත්‍යාංශයේ සේවා කාලයේ ප්‍රමුඛතාවය අනුව ස්ථාන මාරු කරනු ලැබේ.

4.18 විදේශ දූත මණ්ඩල සේවයේ විභාග සමත්වී මෙම අමාත්‍යාංශයෙන් හෝ ඒ යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තුවක සේවයෙන් ඉවත් වූ කළමනාකරණ සේවා නිලධාරියෙකු එම සේවය අවසන් කර නැවත මෙම අමාත්‍යාංශය වෙත හෝ ඒ යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තුවක සේවය සඳහා නැවත පැමිණ ඇත්නම් එම නිලධාරීන් මෙම අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තුවක සේවය කළ පෙර සේවා කාලය නැවත පැමිණි දින සිට අඩුකර ජ්‍යෙෂ්ඨතා ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. (විදේශ දූත මණ්ඩල සේවයෙන් පසු වෙනත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක සේවය කර මෙම අමාත්‍යාංශය හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වෙත ස්ථානමාරු වූ නිලධාරීන් සඳහා අදාළ නොවේ.)

4.19 රේගු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිටියදී විදේශ දූත මණ්ඩල සේවයේ විභාග සමත්වී ගිය නිලධාරීන් එම සේවය අවසන් කර නැවත මෙම අමාත්‍යාංශය හෝ ඒ යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත පැමිණ ඇත්නම් එම නිලධාරීන්හට රේගු දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඇති ඉතිරි කාලසීමාව සඳහා 2027 රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු වන ලේඛනයෙහි පළමුව ස්ථානමාරු ලැබීමට අවස්ථාව හිමි වේ.

4.20 ජ්‍යෙෂ්ඨතා ලේඛනය තුළ රැඳීසිටින රියදුරු සේවයේ නිලධාරීන් රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු ලැබීමට ආසන්නව සිටින අවස්ථාවේ වෙනත් ප්‍රතිලාභ සහිත ස්ථානයක් වෙත ස්ථානමාරුවක් ලබාගැනීමට ඉල්ලුම් කරන්නේනම්, කිසිදු අවස්ථාවක එම ඉල්ලීම් අනුප්‍රාප්තිකයෙකු රහිතව නිර්දේශ නොකළ යුතුය.

4.21 රා.ප.ච. 14/2022 යටතේ දේශීය හෝ විදේශීය නිවාඩු ලබාගත් නිලධාරීන් සිය නිවාඩු කාලසීමාව අවසන් කර පැමිණි පසු ජ්‍යෙෂ්ඨතා ලේඛනය තුළ රැඳීසිටින පරිදි රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු කරනු ලැබේ.

4.22 ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි වැටුප් රහිත විදේශ නිවාඩු ලබාසිටින නිලධාරීන්ගේ විදේශ නිවාඩු කාලසීමාව රේගු දෙපාර්තමේන්තුවේ රැඳී සිටිය හැකි උපරිම සේවා කාලයෙන් අඩුවන අතර වසර 05ක නිවාඩු ලබාගත් නිලධාරීන් නිවාඩු අවසන්කොට පැමිණෙන දින සිට මෙම අමාත්‍යාංශයෙන් / අමාත්‍යාංශය යටතේ වන අදාල දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු ලැබීමට යටත් වේ.

4.23 ස්ථාන මාරුවීම් පිළිබඳ යම්කිසි ගැටලුවක් මතුවුවහොත් අමාත්‍යාංශ ලේකම්තුමාගේ තීරණය අවසන් තීරණය වේ.

**2027 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය සකස් කිරීමේ මණ්ඩලය**
**2026.06.15**